# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 37 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 සැප්තැම්බර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 සැප්තැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 37 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 සැප්තැම්බර් මස 23 වන දින.]

එල්. ඩී.—ඕ. 36/87.

**පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

1. මේ පනත 1987 අංක 37 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **කෙටි නාමය.**

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **383 වන අධිකාරයේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(1) මේ පනතේ උපලේඛනයෙහි 'අ' කොටසේ නිශ්චය කොට දැක්වෙන යම් වරදක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි දඬුවම, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩයක් හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකම හෝ වන්නේ ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 ට ප්‍රථම දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.